# ග්‍රාහක නියමයන් හා කොන්දේසි

eZ Cash ග්‍රාහක නියමයන් හා කොන්දේසි

කොළඹ 02, යුනියන් පෙදෙසේ, අංක 475 දරන ස්ථානයේ සිය ලියාපදිංචි කාර්යාලය පත්වාගෙන යන, සමාගම් අංක PQ38 දරන ඩයලොග් ආසිආටා පීඑල්සී සමාගම (ඩයලොග්) විසින් සලසාදෙනු ලබන eZ Cash සේවාවන් භාවිත කිරීම මෙම නියමයන් හා කොන්දේසි මගින් පාලනය විය යුතුය.

කවර හෝ ග්‍රාහකයෙකුට eZ Cash සේවාවන් සඳහා ලියාපදිංචි වීමට අවකාශ ලබානොදීමේ අයිතිය ගෙවීම් සේවා සැපයුම්කරු තමන් වෙත රඳවා තබා ගනී.

eZ Cash ග්‍රාහක ගණයට අදාළ eZ Cash ගනුදෙනු සීමාවන්/දෛනික ගනුදෙනු සීමාවන් දැනගැනීම සඳහා කරුණාකර www.ezcash.lk වෙබ් අඩවියට පිවිසෙන්න.

1. අර්ථ නිරූපණ

1.1 "පවත්නා ශේෂය" යන්නෙන් මෙහි පනවා ඇති සීමාවන්ට යටත්ව, කවර හෝ යම් අවස්ථාවකදී භාවිත කළ හැකි, මෙම පද්ධතිය තුළ eZ Cash ගිණුමේ ඇති අගය හා සමවන භෞතික මුදල් ප්‍රමාණය අදහස් වේ.

1.2 "දෛනික ගනුදෙනු සීමාවන්" යන්නෙන් කවර හෝ එක් (01) ලිත් දිනයකදී ගනුදෙනු කළ හැකි eZ Cash සේවාවේ සමුච්චිත මුදල අදහස් වේ.

1.3 "eZ Cash" යන්නෙන් eZ Cash ගනුදෙනු සිදුකිරීම සඳහා භාවිත කරනු ලබන විද්‍යුත් ක්‍රම මගින් පමණක් හුවමාරු කරනු ලබන විද්‍යුත් මුදල් අදහස් වේ.

1.4 "eZ Cash ගිණුම" යන්නෙන් eZ Cash ගනුදෙනු කිරීම සඳහා eZ Cash ග්‍රාහකයාට සහ/හෝ eZ Cash වෙළඳ ව්‍යාපාරිකට අවකාශ සලසන පද්ධතිය තුළ පිහිටුවා ඇති පොලී නොලබන ඩිජිටල් ගිණුම අදහස් වේ.

1.5 “eZ Cash වෙළඳ ව්‍යාපාරික” යන්නෙන් ගෙවීම් සේවා සැපයුම්කරුවෙකු හෝ ජංගම දුරකථන සේවා මෙහෙයුම්කරුවෙකු සමග ලියාපදිංචි සහ වෙළඳ නියෝජිතගේ ධාරිතාවය අනුව eZ Cash සේවාවන් නැවත බෙදාහැරීමට සුදුසුකම් ලබන, ගෙවීම් සේවා සැපයුම්කරුගේ ග්‍රාහකයෙක් (පුද්ගලයෙක් හෝ සංවිධානයක්) අදහස් කෙරේ.

1.6 “eZ Cash සේවාව” යන්නෙන් 2005 අංක 28 දරන ගෙවීම් හා පියවීම් පද්ධති පනත යටතේ නිකුත් කරන ලද 2009 අංක 1 දරන ගෙවුම් කාඩ්පත් සේවා සපයන්නන් පිළිබඳ රීති සහ 2009 අංක 1 දරන ගෙවුම් කාඩ්පත් සේවා සපයන්නන් පිළිබඳ රීති සංග්‍රහයේ 21 වන රීතිය යටතේ නිකුත් කර ඇති භාරකාර ගිණුම් පාදක ජංගම ගෙවුම් සේවා සඳහා වන 2011 අංක 2 දරන ජංගම ගෙවුම් මාර්ගෝපදේශ සහ ශ්‍රී ලංකා මහ බැංකුව විසින් හෝ එවැනි වෙනත් නිසි බලධාරියෙකු විසින් නිකුත් කරනු ලබන රීති, නියෝග හා මාර්ගෝපදේශ ප්‍රකාර ගෙවීම් සේවා සැපයුම්කරු විසින් සලසාදෙනු ලබන, මෙහි දක්වා ඇති නියමයන් හා කොන්දේසි වලට යටත්වල eZ Cash ගනුදෙනු සිදුකිරීම සඳහා eZ Cash ග්‍රාහකයාට අවකාශ සලසන ජංගම ගෙවුම් සේවාව අදහස් වේ.

1.7 “eZ Cash ගනුදෙනු” යන්නෙන් 4.1 වගන්තියේ සවිස්තරව දක්වා ඇති ශ්‍රී ලංකා රුපියල් වලින් මෙරට තුළ සිදු කරන ගනුදෙනු අදහස් වේ.

1.8 “eZ Cash ග්‍රාහකයා” යන්නෙන් eZ Cash සේවාව සඳහා ගෙවීම් සේවා සැපයුම්කරු සමග ලියාපදිංචි වී සිටින ගෙවීම් සේවා සැපයුම්කරුගේ ග්‍රාහකයෙකු අදහස් වේ.

1.9 “අනුපාතික බලපෑම” යන්නට දේව ක්‍රියා, කවර හෝ රජයේ හෝ නියාමන බල අධිකාරියක නියමයන්, යුද්ධ, ජාතික හදිසි අවස්ථා, අනතුරු, ගිනි ගැනීම්, අකුණු කෙටීම, උපකරණ ඇණහිටීම, පද්ධතියේ පරිගණක හෝ මෘදුකාංග අක්‍රීය වීම, විදුලිබලය ඇණහිටීම, දෝෂ, ගෙවීම් සේවා සැපයුම්කරුවන්ගේ ජාල වලට හෝ ජාලවලට හෝ කවර හෝ තෙවැනි පාර්ශ්වයක කවර හෝ උපකරණයකට හෝ උපකරණවලට බාධා කිරීම් හෝ විනාශ කිරීම්, කැරළි, වැඩ වර්ජන, පිටමං කිරීම්, (අප සේවකයන් සම්බන්ධවන හෝ එසේ නොවන) කාර්මික ආරාවුල් ඇතුළත් වේ.

1.10 “ජංගම දුරකථන සේවා මෙහෙයුම්කරු” යනුවෙන් eZ Cash සේවා භාවිත කිරීම සහ අත්විඳීම සඳහා ග්‍රාහකයින්ට හැකියාව ලබාදෙමින් ගෙවීම් සේවා සැපයුම්කරු සමග ගිවිසුමකට එළැඹ සිටින ශ්‍රී ලංකාවේ විදුලි සන්නිවේදන සේවා අදහස් කෙරේ

1.11 “MSISDN අංකය” යන්නෙන් ජංගම ග්‍රාහක ඒකාබද්ධ සේවා ඩිජිටල් ජාල අංකය (ජංගම දුරකථන අංකය) අදහස් වේ.

1.12 “පෞද්ගලික අනන්‍යතා අංකය :PIN)” යන්නෙන් eZ Cash ගනුදෙනු සිදුකිරීම පිණිස භාවිත කරනු ලබන පෞද්ගලික අනන්‍යතා අංකය අදහස් වේ.

1.13 “සිම්පත” යන්නෙන් ගෙවීම් සේවා සැපයුම්කරුවන්ගේ ජාලයට පිවිසීම සඳහා ගෙවීම් සේවා සැපයුම්කරුවන්ගේ විසින් ග්‍රාහකයන් වෙත නිකුත් කරනු ලබන ගෙවීම් සේවා සැපයුම් ග්‍රාහක අනන්‍යතා මොඩියුලය අදහස් වන අතර, එය eZ Cash ගනුදෙනු සිදුකිරීම සඳහා යෙදාගනු ලබන eZ Cash ග්‍රාහකයාගේ අදාළ ජංගම දුරකථන අංකය වන්නේය.

1.14 “පද්ධතිය” යන්නෙන් eZ Cash සේවාව යටතේ භාණ්ඩ, නිෂ්පාදන, සේවා හා ගුවන් කාලය සඳහා සහ අරමුදල් මාරුකිරීම සඳහා ගෙවීම් කිරීමට පහසුකම් සැලසීම පිණිස ගෙවීම් සේවා සැපයුම්කරු විසින් ක්‍රියාත්මකකර ඇති ගෙවීම් ක්‍රමවේද පද්ධතිය අදහස් වේ.

1.15 “නියමයන් හා කොන්දේසි” යන්නෙන් ගෙවීම් සේවා සැපයුම්කරු විසින් සිය අභිමතය පරිදි කලින් කල වෙනස් කරනු ලැබිය හැකි මෙහි සඳහන් නියමයන් හා කොන්දේසි අදහස් වේ.

1.16 “USSD”යන්නෙන් ව්‍යුහගත නොකළ පරිපූරක සේවා දත්ත අදහස් වේ.

1.17 “වෙබ් අඩවිය” යන්නෙන් www.ezcash.lk සහ ජංගම දුරකථන සේවා මෙහෙයුම්කරුවන්ගේ ඕනෑම වෙබ් අඩවියක් අදහස් වේ.

2. ආරම්භ වන දිනය

2.1 eZ Cash සේවාව සඳහා eZ Cash ග්‍රාහකයාගේ ලියාපදිංචිය අනුමත කරනු ලබන දින සිට eZ Cash ග්‍රාහකයා විසින් eZ Cash ගනුදෙනු සිදු කිරීම ආරම්භ කළ හැකි අතර, මෙම නියමයන් හා කොන්දේසිවලට අනුව, ලියාපදිංචිය අවසන් කරනු ලැබුවහොත් හෝ අවසන් කරනු ලබන තෙක් ක්‍රියාත්මකව පැවතිය යුතුය.

3. අවම සුදුසුකම්

3.1 eZ Cash සේවාව සඳහා ලියාපදිංචි වීම මගින් eZ Cash ග්‍රාහකයා ශ්‍රී ලංකාවේ පදිංචිකරුවෙක් වන බවටත්, වයස අවුරුදු 18 ඉක්මවූවෙක් බවටත්, තමන් දරන ජංගම ග්‍රාහක ඒකාබද්ධ සේවා අංකිත ජාල (ජංගම දුරකථන අංක) (MSISDN) අංකයේ හිමිකරු වන බවටත් සහතික වන්නේය.

4. eZ Cash සේවාව භාවිත කිරීම

4.1 ගෙවීම් සේවා සැපයුම්කරුවන්ගේ අභිමතය පරිදි, ගෙවීම් සේවා සැපයුම්කරු විසින් පහත සඳහන් කාර්යයන් සඳහා eZ Cash ග්‍රාහකයන් වෙත eZ Cash සේවාව සලසා දෙනු ලැබේ.

4.1.1 කුමන හෝ භාණ්ඩ සහ/හෝ සේවා මිලදී ගැනීමක් වෙනුවෙන් ගෙවීම් කිරීම

4.1.2 බිල්පත් හා උපයෝගිතා ගෙවීම

4.1.3 eZ Cash තැන්පතු හා ආපසු ගැනීම්

4.1.4 එක් eZ Cash ගිණුමකින් වෙනත් ගිණුමකට eZ Cash පැවරීම

4.1.5 අගය එකතු කළ සේවාවන් උදා: ශේෂය පරීක්ෂා කිරීම, පෞද්ගලික අනන්‍යතා අංකය (PIN) වෙනස් කිරීම, කෙටි ගිණුම් ප්‍රකාශන (අවසන් එක් eZ Cash ගනුදෙනු 5 පිළිබඳ විස්තර)

4.1.6 ඒ පිළිබඳව වෙබ් අඩවියේ කලින් කල විස්තර ප්‍රකාශයට පත්කරනු ලබන eZ Cash සේවාව යටතේ සලසා දෙනු ලබන අන් කවර හෝ අතිරේක eZ Cash ගනුදෙනු හෝ පහසුකම්.

4.2 eZ Cash ගිණුම මත කවර හෝ ණයවර, පොළී හෝ ලාභ ලබාගැනීම/ලබාදීම, යම් වට්ටමක් මත eZ Cash නිකුත් කිරීම සහ/හෝ eZ Cash ගිණුමේ පවත්නා ශේෂයේ මූල්‍ය අගය ඉක්මවන අන් කවර හෝ පහසුකමක් සලසාදීම eZ Cash ග්‍රාහකයා විසින් නොකළ යුතුය.

4.3 MSISDN අංකය සතුව පවතින ගුවන් කාලයේ මූල්‍ය අගය eZ Cash ගිණුමට මාරු නොකළ යුතුය. එතකුදු වුවත්, eZ Cash ග්‍රාහකයා විසින් පවත්නා ශේෂය භාවිතකොට ගුවන් කාලය මිලදී ගනු ලැබිය හැකිය.

4.4 eZ Cash ග්‍රාහකයාගේ MSISDN අංකය/සිම් කාඩ්පත නතර කරනු හෝ අවසන් කරනු ලැබුවහොත්, අදාළ eZ Cash ග්‍රාහකයාගේ eZ Cash ගිණුම අවහිර කරනු ලැබිය යුතු අතර, eZ Cash ග්‍රාහකයා හට කුමන හෝ ගෙවීම් සේවා සැපයුම්කරුවන්ගේ සේවා මධ්‍යස්ථාන වලින් සිය මුදල් ආපසු ලබාගත හැකිය.

4.5 eZ Cash ග්‍රාහකයා විසින් eZ Cash ගනුදෙනු සිදුකිරීම මගින් මෙම ගිවිසුමේ දක්වා ඇති පරිදි හා ගෙවීම් සේවා සැපයුම්කරු විසින් කලින් කල දැනුම් දෙනු ලබන පරිදි eZ Cash ගිණුම මත බදු, ගාස්තු හෝ අන් කවර හෝ අදාළ ගාස්තු ඔහුගේ/ඇයගේ eZ Cash ගිණුමෙන් අයකර ගැනීමට ගෙවීම් සේවා සැපයුම්කරු වෙත බලය පවරනු ලැබේ.

4.6 eZ Cash සේවාව සඳහා ලියාපදිංචි වීමෙන් අනතුරුව, eZ Cash ග්‍රාහකයා විසින් සිය පෞද්ගලික අනන්‍යතා අංකය (PIN) වන ඉලක්කම් 4 කින් සමන්විත අංකය ඇතුළත් කළ යුතුය. එම පෞද්ගලික අනන්‍යතා අංකය සියලු කල්හි රහසිගතව තබා ගැනීමෙන් එහි ආරක්ෂාව සලසා ගැනීම පිළිබඳව eZ Cash ග්‍රාහකයා වගකිව යුතු අතර එම පෞද්ගලික අනන්‍යතා අංකය අනාවරණය වීම වළක්වා ගැනීම පිණිස සියලු ක්‍රියාමාර්ග ගත යුතුය.

4.7 පෞද්ගලික අනන්‍යතා අංකය (PIN) සමග MSISDN ජංගම දුරකථන අංකය ඔස්සේ ලැබෙන කවර හෝ තහවුරු කිරීමක් eZ Cash ග්‍රාහකයා විසින් නිකුත් කරනු ලැබ ඇති සේ සැලකිය යුතු අතර එම තහවුරු කිරීම මගින් eZ Cash ග්‍රාහකයා බැඳී සිටිය යුතුය.

4.8 පෞද්ගලික අනන්‍යතා අංකය (PIN) ඇතුළත් කිරීම මගින් eZ Cash සේවාවේ කවර හෝ අංගයකට ප්‍රවේශ වීම eZ Cash ග්‍රාහකයා කෙරෙහි බැඳීමක් ඇති කරනු ඇත.

4.9 eZ Cash ග්‍රාහකයාගේ අවසර ඇතිව හෝ නොමැතිව පෞද්ගලික අනන්‍යතා අංකය (PIN) භාවිත කරමින් eZ Cash ග්‍රාහකයාගේ eZ Cash සේවාවන් වෙත සියලු අභිප්‍රායන් හා කාර්යයන් සඳහා යම් තෙවැනි පර්ශවයක් ප්‍රවේශ වුවහොත්, එම ප්‍රවේශය බලයලත් ප්‍රවේශයක් වශයෙන් ද සිදුකළ eZ Cash ගනුදෙනු සියල්ල වලංගු ගනුදෙනු වශයෙන් ද සැලකිය යුතුය.

4.10 eZ Cash ග්‍රාහකයන් විසින් කරනු ලබන සියලු උපයෝගීතා ගෙවීම් වැඩකරන දින තුනක් (03) තුළ පියවනු ලැබේ.

4.11 eZ Cash ගනුදෙනු කිසිවක් වෙනස් කළ නොහැක.

5. ප්‍රතිඥාභාරය හා වගකීම්

eZ Cash ග්‍රාහකයා විසින් මෙයින් පොරොන්දු වී වගකීමට බැඳෙන වග නම්,

5.1 eZ Cash සේවාව සඳහා ලියාපදිංචි වීම පිණිස ලබාදුන් තොරතුරු සත්‍ය හා නිවැරදි වන බවත්,

5.2 ගෙවීම් සේවා සැපයුම්කරු විසින් කලින් කල ඉල්ලා සිටිය හැකි කවර හෝ අතිරේක තොරතුරු eZ Cash ග්‍රාහකයා විසින් ලබාදිය යුතු අතර එසේ කිරීමට අපොහොසත් වීම ගෙවීම් සේවා සැපයුම්කරු විසින් සිය පරම අභිමතය පරිදි, eZ Cash සේවා අත්හිටුවීමට හෝ අවසන් කිරීමට හේතු විය හැකි බවත්,

5.3 eZ Cash ග්‍රාහකයා විසින් ලබාදෙන තොරතුරු දත්ත ගබඩාවක තැන්පත් කර තැබිය හැකි අතර eZ Cash ග්‍රාහකයාට දැනුම්දීමකින් හෝ ග්‍රාහකයාගේ අනුමැතියකින් තොරව ගෙවීම් සේවා සැපයුම්කරු විසින් අවශ්‍ය යයි සලකනු ලැබිය හැකි පරිදි එම තොරතුරු භාවිත කිරීම, ගබඩා කිරීම, විශ්ලේෂණය කිරීම හා සම්ප්‍රේෂණය කිරීම සහ/හෝ නීතියෙන් නියම කරනු ලැබිය හැකි පරිදි කවර හෝ ව්‍යවස්ථාපිත අධිකාරියක්/ආයතනයක් සමග හුවමාරු කිරීම කරනු ලැබිය හැකි බවත්,

5.4 MSISDN අංකය eZ Cash ග්‍රාහකයාගේ නමින් පමණක් ලියාපදිංචි කරනු ලබන අතර eZ Cash සේවාවන් සඳහා එම අංකය ලියාපදිංචි කිරීමෙන් අනතුරුව, කිසිදු තෙවැනි පක්ෂයක් විසින් එම වීෂිෘහ අංකයෙහි හිමිකාරත්වය පිළිබඳව හිමිකම් නොකියනු ඇති බවත්,

5.5 eZ Cash ග්‍රාහකයා විසින් මෙම නියමයන් හා කොන්දේසිවල විධිවිධාන කිසිවක් උල්ලංඝනය නොකරන බවත්,

5.6 eZ Cash ග්‍රාහකයා විසින් පවත්නා හෝ අනාගතයේදී පනවනු ලබන අදාළ සියලු නීති, ආඥාපනත්, සංග්‍රහ, රීති, රෙගුලාසි, අදාළ බලධාරීන්ගේ දැන්වීම් උපදෙස් හෝ නියෝග හෝ eZ Cash සේවා සම්බන්ධයෙන් ගෙවීම් සේවා සැපයුම්කරු විසින් ලබා දෙනු ලබන කවර හෝ දැන්වීම් උපදෙස් නියෝග හෝ මාර්ගෝපදේශවලට අනුකූලව ක්‍රියාකරනු ඇති බවත්,

5.7 eZ Cash ග්‍රාහකයා විසින් eZ Cash ගිණුමක් වංචනිකව ලියාපදිංචි නොකළ යුතුය. eZ Cash ග්‍රාහකයා විසින් යම් පුද්ගලයෙකු හෝ වෙනත් නෛතික ආස්තිත්වයක් වන වෙනත් ග්‍රාහකයෙකු වශයෙන් පුද්ගලානුරූඪ කරන බව ගෙවීම් සේවා සැපයුම්කරු විසින් අනාවරණය කළහොත්, එම වංචනික ක්‍රියාව හේතු කොට පැන නැගිය හැකි කවර හෝ ආධීනතාවක් සම්බන්ධයෙන් එම eZ Cash ග්‍රාහකයා තනිව වගකිව යුතුය. eZ Cash සේවාව අයථා අන්දමින් පරිහරණය කිරීම, eZ Cash සේවාව වහාම අවසන් කිරීමට/ අත්හිටුවීමට සහ අදාළ බලධාරීන් වෙත ඒ පිළිබඳව දැනුම්දීමට තුඩුදිය හැකි බවත්,

5.8 අදාළ සියලු නීති හා රෙගුලාසි යටතේ eZ Cashග්‍රාහකයා විසින් eZ Cash සේවාව කවර හෝ නීති විරෝධී ක්‍රියාවක් සඳහා භාවිත නොකළ යුතු බවත්,

5.9 eZ Cash ග්‍රාහකයා විසින් ඔහුට/ඇයට අදාළ බලයලත් දෛනික ගනුදෙනු සීමාව ඇතුළත කවර හෝ මුදලක් eZ Cash ගිණුමේ තැන්පත් කිරීම හෝ යෙදවීම කළ හැකිය. ගෙවීම් සේවා සැපයුම්කරු විසින් ශ්‍රී ලංකා මහ බැංකුවේ අනුමැතියට හා රෙගුලාසිවලට යටත්ව, ඒ පිළිබඳව eZ Cash ග්‍රාහකයා වෙත දැනුම්දීමෙන් eZ Cash ගිණුමේ සීමාව සංශෝධනය කරනු ලබිය හැකි බවත්,

5.10 MSISDN අංකය මගින් සත්‍යායනය කරන ලද පෞද්ගලික අනන්‍යතා අංකයට (PIN) අදාළ eZ Cash ගනුදෙනු පිළිබඳ සියලු වාර්තා අනුගම්‍ය වන අතර eZ Cash ග්‍රාහකයාගේ ලියාපදිංචිය පිළිබඳව තීරණාත්මක සාක්ෂියක් වන බවත්,

5.11 eZ Cash ග්‍රාහකයා විසින් සිදුකරන සියලු eZ Cash ගනුදෙනු පිළිබඳවත්, සිය eZ Cash ගිණුම පිළිබඳ වාර්තා තබා ගැනීම පිළිබඳවත් eZ Cash ග්‍රාහකයා වගකිව යුතු වන්නේය,

5.12 ශ්‍රී ලංකා මහ බැංකුව සහ/හෝ අන් කවර හෝ නියාමන හෝ රජයේ බල අධිකාරියක් විසින් නිශ්චිතව දක්වනු ලබන එවැනි වෙනත් අදාළ නිශ්චිත නියමයන්, කොන්දේසි, රීති හා රෙගුලාසිවලට eZ Cash සේවාව භාවිත කිරීම යටත් වන බවත්,

5.13 ගෙවීම් සේවා සැපයුම්කරු ලිඛිත අවසරයකින් තොරව, eZ Cash සේවාව හෝ eZ Cash ග්‍රාහකයාගේ eZ Cash ගිණුම මගින් කරනු ලබන eZ Cash ගනුදෙනු අන් කවර හෝ තෙවැනි පාර්ශ්වයකට පැවරීම හෝ පවරාදීම නොකළ හැකි අතර, eZ Cash ග්‍රාහකයා විසින් පමණක් භාවිත කරනු ලැබිය යුතුය. ගෙවීම් සේවා සැපයුම්කරුගේ ලිඛිත එකඟත්වයකින් තොරව eZ Cash ග්‍රාහකයකු විසින් eZ Cash සේවාව කවර හෝ තෙවැනි පර්ශ්වයකට පැවරීම හෝ පවරාදීම කරන කොට උද්ගතවන කුමන හෝ (සෘජු හෝ වක්‍ර) පිරිවැය, අලාභ, හෝ හානි හෝ ආදායම් අහිමිවීම් ලාභ අහිමිවීම, හෝ කුමන හෝ ආකාරයේ වෙනත් ආනුෂංගික අලාභ සම්බන්ධයෙන් ගෙවීම් සේවා සැපයුම්කරු වගකිව යුතු නොවන බවත්,

5.14 කිසිම හේතුවක් මත ග්‍රාහකයා විසින් eZ Cash සේවාව ආරක්‍ෂක මෙවලමක් වශයෙන් භාවිත නොකළ යුතුය

5.15 ගනුදෙනුවේ වටිනාකම හා ලැබුම්කරුගේ තොරතුරු ඇතුළු එහෙත් ඊට පමණක් සීමා නොවන සියලු eZ Cash ගනුදෙනු පිළිබඳව පරීක්ෂාකර බැලීමේ හා සැබෑ බවට තහවුරු කරගැනීමේ වගකීම eZ Cash ග්‍රාහකයා සතුවිය යුතුය. eZ Cash ග්‍රාහකයාගේ නොසැලකිල්ල හේතුවෙන් සිදුවන සාවද්‍ය සටහන් අවලංගු කරන ලෙසට කරන ඉල්ලීම් ගෙවීම් සේවා සැපයුම්කරු විසින් භාරගනු නොලබන බවත්,

5.16 අසම්පූර්ණ හෝ දෝෂ සහගත දත්ත හෝ ගෙවීම් සේවා සැපයුම්කරු වෙතින් ලැබුනේ යයි අපේක්ෂා කළ නොහැකි තොරතුරු හෝ දත්ත හෝ කවර හෝ සැකකටයුතු තොරතුරු

හෝ පණිවිඩයක් ලැබුනු විගස eZ Cash ග්‍රාහකයා විසින් වහාම ඒ පිළිබඳව ගෙවීම් සේවා සැපයුම්කරු වෙත දැනුම් දිය යුතුය. eZ Cash ග්‍රාහකයා විසින් එවැනි දත්ත හෝ තොරතුරු සිය ජංගම දුරකථනයෙන් මකා ඉවත්කර දැමිය හැකි බවත්,

5.17 සැබෑ බවට තහවුරු කරගැනීමේ හා අන් කවර හෝ නෛතික කාර්යයක් සඳහා eZ Cash ග්‍රාහකයාගේ නම හා MSISDN අංකය සහ එවැනි අනෙකුත් පෞද්ගලික තොරතුරු ගෙවීම් සේවා සැපයුම්කරු විසින් අන් කවර හෝ තෙවැනි පාර්ශ්වයකට ලබාදිය හැකිබව eZ Cash ග්‍රාහකයා මෙයින් පිළිගන්නා බවත් ය.

**6. වගකීමෙන් මුක්තවීම**

6.1 නීතියෙන් අවසරලත් පූර්ණ මට්ටමට ප්‍රකාශිත හෝ ගම්‍යමාන කවර හෝ නියෝජනයකින් තොරව, “ඒ පරිද්දෙන්” යන පදනම මත eZ Cash සේවාව ලබාදෙනු ලැබේ. eZ Cash ග්‍රාහකයා විසින් eZ Cash සේවාව භාවිත කිරීමේ අවදානම තමා විසින්ම දරාගත යුතුය.

6.2 ගෙවීම් සේවා සැපයුම්කරුගේ කවර හෝ චේතනාත්විත නොසැලකිල්ල මගින් හෝ හේතුවෙන් eZ Cash සේවාව නිකුත්කිරීම, භාවිත කිරීම. ඉවත්කරගැනීම සහ/හෝ අවසන් කිරීම කරණ කොට හෝ එමගින් eZ Cash ග්‍රාහකයාට සහ/හෝ යම් තෙවැනි පාර්ශ්වයකට විඳගැනීමට සිදුවන කවර හෝ අලාභ, හානි, පිරිවැය හෝ වියදම් සම්බන්ධයෙන් ගෙවීම් සේවා සැපයුම්කරු එවැනි කිසිදු තැනැත්තෙකුට වගකිව යුතු හෝ වගකීමට බැඳී නොසිටිය යුතුය.

6.3 eZ Cash ග්‍රාහකයා හා ගනුදෙනුකාර තෙවැනි පාර්ශවයක් අතර eZ Cash සේවාව මාර්ගයෙන් සිදුකරනු ලබන කවර හෝ ගනුදෙනුවක් සම්බන්ධයෙන් ගෙවීම් සේවා සැපයුම්කරු වගකිව යුතු නොවන්නේය. ගනුදෙනු වලදී ඇතිවන කවර හෝ ආරාවුල්, දෝෂ හා අතපසුවීම් eZ Cash ග්‍රාහකයා සහ අදාළ ගනුදෙනුකාර පාර්ශවය අතර විසඳාගත යුතුය.

6.4 eZ Cash ග්‍රාහකයා විසින් සිය පෞද්ගලික අනන්‍යතා අංකය (PIN) සමග එවනු ලබන තහවුරු කිරීම් මත ක්‍රියාකිරීම සම්බන්ධයෙන් ගෙවීම් සේවා සැපයුම්කරු වගකිව යුතු නොවන්නේය. එම තහවුරු කිරීම පිළිබඳ කවර හෝ දෝෂ, වංචා, වංචනික ක්‍රියා, නොසැලකිලිමත්භාවයන්, තහවුරු කිරීමේ පද සම්බන්ධතාව පිළිබඳ නොපැහැදිලිතාවන් හෝ

අනවබෝධයන් කවරක් වුවද එය නොසලකා, එම තහවුරු කිරීම ගෙවීම් සේවා සැපයුම්කරු වෙත ලැබුණු විට එය අවලංගු නොකළහැකි විය යුතු හා eZ Cash ග්‍රාහකයා කෙරෙහි බැඳී පැවතිය යුතුය.

7. ගිණුම් ප්‍රකාශ

7.1 USSD පරිගණක ක්‍රමය මගින් ලුහුඬු ගිණුම් ප්‍රකාශයක් ලබා ගැනීමේ ප්‍රවේශය eZ Cash ග්‍රාහකයාට හිමිවිය යුතුය. eZ Cash ග්‍රාහකයා විසින් ඉල්ලීමක් කළ විට, එම ඉල්ලීම කළ දින සිට මාස තුනක (03) උපරිම කාලයක් සඳහා සවිස්තර ගිණුම් ප්‍රකාශයක් යම් ගාස්තුවක් මත ලබාදෙනු ඇත.

8. පාලනය වන නීතිය සහ ආරාවුල් නිරවුල් කිරීම

8.1 මෙම නියමයන් හා කොන්දේසි ශ්‍රී ලංකාවේ නීතිය මගින් පාලනය විය යුතු අතර, ඒ අනුව තේරුම්ගත යුතුය. මෙම නියමයන් හා කොන්දේසි පිළිබඳ සියලු කාර්යයන් සම්බන්ධයෙන් ශ්‍රී ලංකා අධිකරණයේ අනන්‍ය නොවන අධිකරණ බලය eZ Cash ග්‍රාහකයා විසින් මෙයින් අවලංගු කළ නොහැකි පරිදි හා කොන්දේසි විරහිතව පිළිගනී.

8.2 මෙම නියමයන් හා කොන්දේසි වෙනත් භාෂාවන්ට පරිවර්තනය කරනු ලැබිය හැකි අතර, එමගින් පැනනැගිය හැකි කවර හෝ අනනුකූලතාවක් හෝ අපැහැදිළිතාවක් වෙතොත්, එවැනි කවර හෝ භාෂා අනුවාදයක් අභිබවා ඉංග්‍රීසි භාෂා අනුවාදය බල පැවැත්විය යුතුය.

8.3 eZ Cash ගනුදෙනුවක් සිදුවූ දින සිට සහ/හෝ eZ Cash ගිණුම මත ගාස්තු, වෙනත් අය කිරීම් සහ බදු අය කළ දින සිට මාස එකක (01) කාලයක් තුළ දී එම ගනුදෙනුව හෝ එවැනි ගාස්තු, වෙනත් අයකිරීම් සහ බදු සම්බන්ධයෙන් eZ Cash ග්‍රාහකයා විසින් හබ කරනු ලැබිය හැකිය.

8.4 එවැනි සියලු හබ නිරාකරණය කිරීමට හෝ පියවීමට ගෙවීම් සේවා සැපයුම්කරු විසින් සියලු ප්‍රයත්නයන් දැරිය යුතු අතර, එවැනි හබ සම්බන්ධයෙන් ගෙවීම් සේවා සැපයුම්කරුගේ තීරණය අවසානාත්මක හා තීරණාත්මක වන බවට eZ Cash ග්‍රාහකයා මෙයින් එකඟ වේ.

8.5 මෙහි සඳහන් eZ Cash ගනුදෙනු සඳහා ගෙවීම් සේවා සැපයුම්කරු විසින් පවත්වාගෙන යනු ලබන ලොග් සටහන් ලේඛනය, කවර හෝ ආකාරයේ ආරවුලක් පිලිබඳ පිළිගත හැකි තොරතුරු මූලාශ්‍රය වශයෙන් සලකනු ලබන අතර, කවර හෝ ආරාවුල් නිරාකරණයකදී එම ලොග් සටහන් ලේඛනයෙන් ලබාගන්නා තොරතුරු අවසානාත්මක හා තීරණාත්මක සාක්ෂි විය යුතුය.

9. ගාස්තු සහ අය කිරීම්

9.1 eZ Cash ග්‍රාහකයා විසින් eZ Cash සේවාවන් සඳහා පවත්නා සේවා ගාස්තුව සහ එක් එක් eZ Cash ගනුදෙනුව සඳහා වන eZ Cash ගනුදෙනු ගාස්තු ගෙවනු ලැබිය යුතුය. අදාළ ගාස්තු සහ අය කිරීම් ගෙවීම් සේවා සැපයුම්කරු විසින් කලින් කල ප්‍රකාශයට පත් කරනු ලබන ගාස්තු ප්‍රමාණ මත පදනම් විය යුතුය. eZ Cash ග්‍රාහකයා වෙත දැනුම්දීමකින් ගාස්තු සහ අය කිරීම් කවර හෝ අවස්ථාවක වෙනස් කිරීමට හෝ සංශෝධනය කිරීමට ඇති අයිතිය ගෙවීම් සේවා  තමන් වෙත රඳවා තබා ගනී. නවතම ගාස්තු පිළිබඳව දැනගැනීමට වේබ් අඩවියට පිවිසෙන්න.

9.2 eZ Cash වෙළඳසැල් මගින් කරනු ලබන eZ Cash ගනුදෙනු සඳහා වන ගාස්තු සහ ගෙවීම් සේවා සැපයුම්කරු විසින් කලින් කල පනවනු ලබන අන් කවර හෝ ගාස්තු ගෙවීම eZ Cash ග්‍රාහකයාගේ වගකීම යුතුය.

10. eZ Cash ගනුදෙනු සීමාව

10.1 ශ්‍රී ලංකා මහ බැංකුවේ අනුමැතිය මත, ගෙවීම් සේවා සැපයුම්කරු විසින් කලින් කල eZ Cash ගනුදෙනු සීමාව(වන්) නියම කරනු ලැබිය හැකිය.

11. වංචනික භාවිතය හෝ නැතිවූ/සොරකම් කළ සිම්පත සහ/හෝ ජංගම දුරකථන

11.1 eZ Cash සේවාව සියලු කල්හි ගෙවීම් සේවා සැපයුම්කරුගේ දේපලක් වන බවත් එසේ දේපලක් වශයෙන් පවතින බවත් eZ Cash ග්‍රාහකයා විසින් පිළිගන්නා අතර,

11.1.1 eZ Cash සේවාව දැරීමේදී හා භාවිතයෙදී නිසි ප්‍රවේශමෙන් සහ අනලස්භාවයෙන් යුතුව ක්‍රියා කළ යුතුය.

11.1.2 eZ Cash සේවාවට අනවශ්‍ය ලෙස බලපෑම් නොකළ යුතු අතර අන්‍යයන්ට අනවශ්‍ය බලපෑම් කිරීමට ඉඩ නොදිය යුතුය.

11.2 eZ Cash ග්‍රාහකයාගේ ජංගම දුරකථනය සම්බන්ධයෙන් වන කවර හෝ නැතිවීමක්, වංචනික ක්‍රියාවක්, සැකකටයුතු වංචනික ක්‍රියාවක්, වංක භාවිතාව හෝ සොරකම් කිරීමක් හෝ eZ Cash ගිණුම නීතිවිරෝධී අයුරින් භාවිත කිරීමක් පිළිබඳව eZ Cash ග්‍රාහකයා විසින් වහාම ගෙවීම් සේවා සැපයුම්කරුගේ පාරිභෝගික සේවාව වෙත සහ පොලීසිය වෙත දැනුම්දිය යුතුය. eZ Cash සේවා සම්බන්ධතාව අත්හිටුවීම පිණිස ඉහත කී පරිදි eZ Cash ග්‍රාහකයා විසින් ගෙවීම් සේවා සැපයුම්කරු වෙත දැනුම්දෙන තෙක්, ජංගම දුරකථනය නැතිවීමට/සොරකම් කිරීමට හෝ eZ Cash සේවාව වංචනිකව භාවිත කිරීමට අදාළ සියලු ගාස්තුවලට eZ Cash ග්‍රාහකයා යටත් විය යුතුය.

11.3 නැතිවූ හෝ සොරකම්කළ සිම්පත නැවත ලබාදීම, ගෙවීම් සේවා සැපයුම්කරු විසින් නිශ්චය කරනු ලබන පරිදි අතිරේක ගාස්තුවකට යටත් වේ.

11.4 ඉහත කුමක් සඳහන් වුවද, eZ Cash සේවාව වංචනිකව භාවිත කර ඇති බවට, සොරකම් කර ඇති බවට හෝ අනවශ්‍ය අතපෙවීම් සිදුකර ඇති බවට සැකයක් වේ නම් හෝ eZ Cash සේවා භාවිතාව පද්ධතියට හානිකර බවට ගෙවීම් සේවා සැපයුම්කරු තීරණය කරන්නේ නම්, ගෙවීම් කිරීම සඳහා eZ Cash සේවාව භාවිත කිරීම ගෙවීම් සේවා සැපයුම්කරු විසින් ප්‍රතික්ෂේප කරනු ලැබිය හැකි අතර, එහි ප්‍රතිඵලයක් වශයෙන් eZ Cash ග්‍රාහකයාට විඳීමට සිදුවන කවර හෝ අලාභ, පිරිවැය හෝ හානි සම්බන්ධයෙන් ගෙවීම් සේවා සැපයුම්කරු වගකිව යුතු නොවන්නේය.

12. අවසන් කිරීම සහ අත්හිටුවීම

12.1 ගෙවීම් සේවා සැපයුම්කරු විසින් තම පරම අභිමතය පරිදි, ඒ පිලිබඳව eZ Cash ග්‍රාහකයාට දැනුම්දීමෙන්, eZ Cash සේවාව භාවිත කිරීම වහාම අවසන් කිරීම, අත්හිටුවීම හෝ eZ Cash සේවාව කාර්ය පටිපාටි, මෙහෙයුම් ක්‍රමය වෙනස් කිරීම සම්බන්ධයෙන් eZ Cash ග්‍රාහකයා කෙරෙහි, කොන්දේසි හෝ සීමාවන් පැනවීම කරනු ලැබිය හැකිය.

12.2. ඉහත 12.1 වගන්තිය නොසලකා, තම පරම අභිමතය පරිදි, කවර හෝ අවස්ථාවක eZ Cash ග්‍රාහකයා විසින් eZ Cash සේවාව භාවිත කිරීම පහත සඳහන් පරිවේෂණයන් ඇතුළු එහෙත් ඊට සීමා නොවන කවර හෝ කරුණක් මත වහාම අත්හිටුවීමේ/අවසන් කිරීමේ අයිතිය ගෙවීම් සේවා සැපයුම්කරු තමන් වෙත රඳවා තබා ගනී.

12.2.1 ගෙවීම් සේවා සැපයුම්කරුගේ මතයට අනුව, eZ Cash ග්‍රාහකයා විසින් කවර හෝ වංක, වංචනික, නීතිවිරෝධි සහ/හෝ සාපරාධී ක්‍රියාවක හෝ අවනිදේශනයක නිරතවී තිබීම,

12.2.2 eZ Cash ග්‍රාහකයා විසින් නියමයන් හා කොන්දේසිවල ප්‍රතිපාදන කවරක් හෝ උල්ලංඝණය කිරීම හෝ ගෙවීම් සේවා සැපයුම්කරුට අගතිදායක කුමන හෝ ක්‍රියාවක නිරතවී තිබීම,

12.2.3 කවර හෝ පාර්ශ්වයක්, නියාමන ආයතනයක් හෝ රජයේ ආයතනයක් විසින් පනවනු ලැබූ, කවර හෝ පනත්, ප්‍රඥප්ති, නීති, අතුරු ව්‍යවස්ථා, රීති සහ/හෝ නියෝග කිසිවක් eZ Cash ග්‍රාහකයා විසින් උල්ලංඝණය කිරීම,

12.2.4 eZ Cash ග්‍රාහකයා විසින් eZ Cash සේවාව සඳහා ඉල්ලුම් කිරීමේදි ව්‍යාජ ලේඛන ඉදිරිපත් කර තිබීම හෝ අසත්‍ය තොරතුරු ප්‍රකාශ කොට තිබීම,

12.2.5 eZ Cash ග්‍රාහකයා අයහපත් හෝ ද්වේශ සහගත අභිප්‍රායෙන් යුතුව ක්‍රියාකර තිබීම, සහ/හෝ

12.2.6 eZ Cash ග්‍රාහකයාගේ ක්‍රියාවන් ගෙවීම් සේවා සැපයුම්කරුගේ අයිතිවාසිකම් වලට අගතිදායක වන බව ගෙවීම් සේවා සැපයුම්කරු අදහස් කිරීම.

12.3 ජංගම දුරකථන සේවාවන් සඳහා ගෙවීම් සේවා සැපයුම්කරු සමග වන ගිවිසුම අවසන් කරනු ලැබුවහොත්, eZ Cash සේවාව ස්වයංක්‍රීයව අවසන් වනු ඇත.

12.4 eZ Cash ග්‍රාහකයා විසින් ඔහුගේ/ඇයගේ MSISDN අංකය හෝ ලියාපදිංචි නාමය වෙනස් කරනු ලැබුවහොත්, eZ Cash ග්‍රාහකයා විසින් මෙම නියමයන් හා කොන්දේසි යටතේ නැවත ලියාපදිංචි විය යුතුය.

12.5 eZ Cash ග්‍රාහකයා විසින් ගෙවීම් සේවා සැපයුම් ශාඛාවන් මාර්ගයෙන් යථා පරිදි ඉදිරිපත් කරනු ලබන eZ Cash ගිණුම අවසන් කිරිම පිළිබඳ පූර්ව ලිඛිත නිවේදනය ගෙවීම් සේවා සැපයුම්කරු වෙත ලබාදීම මගින් කවර හෝ අවස්ථාවක eZ Cash සේවාව අවසන් කරනු ලැබිය හැක. එකී ලිඛිත ඉල්ලීම ලැබීමෙන් පසුව, ගෙවීම් සේවා සැපයුම්කරු විසින් ගිණුමේ ඉතිරිව ඇති ශේෂය දින තුනක් ඇතුළත ආපසු භාරදිය යුතුය.

12.6 eZ Cash සේවාව අවසන් වු හෝ කල් ඉකුත් වූ පසුව eZ Cash ග්‍රාහකයා විසින් eZ Cash ගිණුම වසා නොදමයි නම්, ඒ පිළිබඳ වැඩිදුර දැනුම්දීමකින් හෝ එසේ දැනුම්දීමකින් තොරව, eZ Cash ග්‍රාහකයාගේ eZ Cash ගිණුම අත්හිටුවීමේ හෝ අවසන් කිරීමේ අයිතිය ගෙවීම් සේවා සැපයුම්කරු තමන් වෙත රඳවා තබා ගනී.

13. අවසන් කිරීමේ/අත්හිටුවීමේ ප්‍රතිඵලය

13.1 eZ Cash සේවාව අවසන්වූ හෝ කල් ඉකුත්වූ පසු, eZ Cash ගිණුමේ පවත්නා ශේෂය, ගෙවීම් සේවා සැපයුම්කරු විසින් නියම කරනු ලබන පරිපාලන ගාස්තු හා අය කිරීම් අඩුකර ගැනීමෙන් පසුව ආපසු ගෙවනු ලැබිය යුතුය.

13.2 ගෙවීම් සේවා සැපයුම්කරු විසින් 12 වගන්තිය ප්‍රකාර eZ Cash සේවාව හෝ එහි කවර හෝ කොටසක් අවසන් කරනු හෝ අත්හිටවනු ලැබුව හොත්, අදාළ වන පරිදි අදාළ බලධාරීන්ගේ නිෂ්කාශනය ලබාගැනීමෙන් මිස හෝ එසේ ලබන්නා තෙක්, eZ Cash ගිණුමේ ඉතිරිව පවත්නා ශේෂය ආපසු ගෙවීමට හෝ ආපසු භාරදීමට ගෙවීම් සේවා සැපයුම්කරු බැඳී නොසිටිය යුතු බවට eZ Cash ග්‍රාහකයා තවදුරටත් එකඟ වේ.

13.3 eZ Cash සේවාව අත්හිටවනු ලැබූ පසු, සම්බන්ධතාව ප්‍රතිස්ථාපනය කිරීමේ ගාස්තුවකට සහ ගෙවීම් සේවා සැපයුම්කරු වෙත ලැබිය යුතු සියලු හිඟ මුදල් සහ/හෝ eZ Cash ගිණුම ප්‍රතිස්ථාපනය කිරීම සඳහා ගෙවීම් සේවා සැපයුම්කරු විසින් නියම කරනු ලැබිය හැකි අන් කවර හෝ මුදලක් ගෙවීමට යටත්ව, ගෙවීම් සේවා සැපයුම්කරු විසින් තම පරම අභිමතය පරිදි eZ Cash සේවාව ප්‍රතිස්ථාපනය කරනු ලැබිය හැකිය.

13.4 මෙම නියමයන් හා කොන්දේසි යටතේ හෝ නීතියෙන් ගෙවීම් සේවා සැපයුම්කරු සතු අන් කවර හෝ අයිතිවාසිකමකට සහ ප්‍රතිකර්මයකට මෙම 13 වන වගන්තියේ විධිවිධාන කිසිදු ආකාර අගතියකින් තොර වන්නේය.

14. නියමයන් හා කොන්දේසි සංශෝධනය හා ප්‍රතිශෝධනය

14.1 14.2 වගන්තියට යටත්ව සහ අනන්‍යාකාරයෙන් ප්‍රකාශිතව සඳහන් කර ඇත්නම් මිස, ගෙවීම් සේවා සැපයුම්කරු විසින් උචිත යයි සලකනු ලබන පරිදි, ඒ පිළිබඳව කිසිදු දැනුම්දීමකින් තොරව මෙම නියමයන් හා කොන්දේසි කවරක් හෝ කලින් කල සමාලෝචනය කිරීමට, සංශෝධනය කිරීමට, එකතු කිරීමට හෝ වෙනස් කිරීමට ඇති අයිතිය ගෙවීම් සේවා සැපයුම්කරු තමන් වෙත රඳවා තබා ගන්නා අතර, එම නියමයන් හා කොන්දේසි සංශෝධනය කිරීම්, එකතු කිරීම් හෝ වෙනස් කිරීම් මගින් eZ Cash ග්‍රාහකයා බැඳීසිටිය යුතුය.

14.2 මෙම නියමයන් හා කොන්දේසි යටතේ එකී නියමයන් හා කොන්දේසි සංශෝධන කිරීම් පිළිබඳ කවර හෝ නිවේදන ගෙවීම් සේවා සැපයුම්කරු විසින් සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂාත්‍රයෙන් සුදුසු සන්නිවේදන මාධ්‍යයක් ඔස්සේ eZ Cash ග්‍රාහකයා වෙත භාරදිය යුතුය.

**15. ආධීනතා සීමාව සහ හානිපූර්ණය**

15.1 නීතියෙන් අවසර ලැබී ඇති මුළු ප්‍රමාණයට සහ මෙම ගිවිසුමේ අන් කවර හෝ විධිවිධානයක් නොසලකා, මෙම ගිවිසුම මගින් පැනනගින සියලු ආධීනතා ගෙවීම් සේවා සැපයුම්කරු විසින් බැහැර කරනු ලැබේ.

15.2 eZ Cash ග්‍රාහකයා විසින් eZ Cash සේවාව භාවිත කිරීම හෝ කුමන හෝ කරුණක් හේතුවෙන් පැන නගින කවර හෝ (සෘජු හෝ වක්‍ර) පිරිවැය, අලාභ හෝ හානි සම්බන්ධයෙන් හෝ කිසියම් ආදායම් අහිමි වීම්, ලාබ අහිමි වීම් හෝ කවර හෝ ආනුශංගික අලාභ සම්බන්ධයෙන් ගෙවීම් සේවා සැපයුම්කරු වගකීමට යටත් නොවිය යුතුය. ඉහත කුමක් සඳහන් වුවද, ගිවිසුමට හා (ව්‍යවස්ථාපිත වගකීම් පැහැර හැරීම හෝ කඩකිරීම ඇතුළු) සිවිල් වරදට යටත් හෝ අනන්‍යාකාර eZ Cash ග්‍රාහකයා කෙරෙහි වන ගෙවීම් සේවා සැපයුම්කරුගේ පූර්ණ ආධීනතාව eZ Cash ග්‍රාහකයාගේ eZ Cash ගනුදෙනුවේ වටිනාකමට පමණක් සීමාවිය යුතුය.

15.3 eZ Cash සේවාව හෝ එහි කවර හෝ කොටසක් හරහා සම්ප්‍රේෂණය කළ, ලැබුණු හෝ ගබඩා කළ ද්‍රව්‍ය මගින් පැනනගින කවර හෝ වංචනික ක්‍රියා, අතපසුකිරීම්, ලිඛිත අපහාස, පෞද්ගලිකත්වය පැහැරගැනීම, ප්‍රකාශන අයිතිය, පේටන්ට් බලපත්‍ර උල්ලංඝණය කිරීම, විශ්වාසය හෝ වරප්‍රසාද කඩකිරීම හෝ කිසියම් නීතියක් හෝ නියෝගයක් උල්ලංඝණය කිරීම සම්බන්ධයෙන් වූ කවර හෝ හිමිකම් පෑම් සහ eZ Cash ග්‍රාහකයාගේ කවර හෝ ක්‍රියාවක් හෝ පැහැරහැරීමක් හෝ eZ Cash සේවාව හෝ එහි කිසියම් කොටසක් කවර හෝ අනවසර භාවිතාව හෝ අයථා පරිහරණය මගින් පැනනගින අන් සියලු හිමිකම් පෑම් කරණකොට උද්ගතවන කවර හෝ අලාභ, හානි, ආධීනතා හෝ වියදම් වලින් ගෙවීම් සේවා සැපයුම්කරු හානිපූරණය කොට වගකීමෙන් ආරක්ෂාකොට තැබීමට eZ Cash ග්‍රාහකයා මෙයින් එකඟ වේ.

## 16. eZ Cash සේවාව සඳහා පාරිභෝගික සේවා අංක

16.1 වැඩි විස්තර සඳහා කරුණාකර 7111 අමතන්න.

## 17. අනුපාතික බලපෑම

17.1 මේ යටතේ වන ස්වකීය බැඳීම් කවරක් හෝ ඉටුකිරීමට අනුපාතික බලපෑමක් හේතුවෙන් බාධාවූ බව යම් පක්ෂයක් විශ්වාස කරයි නම්, එම සිදුවීම පිළිබඳව එම පක්ෂය විසින් අනෙක් පක්ෂය වෙත ලිඛිතව දැනුම්දිය යුතුය. එසේ කිරීමට අපොහොසත් වුවහොත්, එවැනි පරිවේෂණයන් හමුවේ නිදහසට කරුණක් වශයෙන් එම අනුපාතික බලපෑම ගෙනහැර දැක්වීමෙන් එම පක්ෂය වළක්වාලිය යුතුය. අනුපාතික බලපෑමට යටත් වන සිදුවීම මාස තුනකට (3) වඩා වැඩි කාලයක් පවතින්නේ නම්, මෙම නියමයන් හා කොන්දේසිවල 12

වගන්තිය නොසලකා, දෙපක්ෂයේ කවර හෝ එක් පක්ෂයක් විසින් අනෙක් පක්ෂය වෙත දැනුම්දීමෙන් eZ Cash සේවාව අවසන් කිරීමේ අයිතිය දෙපක්ෂයටම හිමිවිය යුතුය.

18. නියමයන් හා කොන්දේසි පිළිබඳ කතිපය හා බලපෑම

18.1 කවර හෝ අදාළ නීතියක් යටතේ මෙහි අන්තර්ගත කවර හෝ විධිවිධානයක් අවලංගු, නීතිවිරෝධී හෝ බලාත්මක නොකළහැකි වුවහොත්, එමගින් මෙහි අන්තර්ගත සෙසු විධිවිධාන කෙරෙහි කිසිදු බලපෑමක් හෝ අගතියක් සිදු නොවිය යුතු අතර එම අවලංගු, නීතිවිරෝධී හෝ බලාත්මක නොකළහැකි විධිවිධානය ඉවත් කරනු ලැබූ සේ සැලකිය යුතුය.

19. නිවේදන

19.1. අන්‍යාකාරයෙන් නියම කර ඇත්නම් මිස, ගෙවීම් සේවා සැපයුම්කරු විසින් සිය වෙබ් අඩවියේ හෝ යටත් පිරිසෙයින් නිතිපතා පළවන එක් සිංහල, දෙමළ හා ඉංග්‍රීසි පුවත්පතක පළකිරීමෙන් හෝ විද්‍යුත් තැපෑල හෝ පෙරගෙවුම් තැපෑල මගින් හෝ eZCash ග්‍රාහකයාගේ MSISDN අංකය වෙත ලිඛිත පණිවුඩයක් යැවීම මගින් හෝ eZ Cash ග්‍රාහකයා වෙත දැන්වීම් ලබාදිය හැකිය. සැක සහිත කරුණු නිරාකරණය කරගැනීම සඳහා ගෙවීම් සේවා සැපයුම්කරු විසින් ඉහත කුමන ආකාරයකින් හෝ ග්‍රාහකයා වෙත දැන්වීම කළ යුතුය.

19.2. එසේ ලබාදෙන දැන්වීම, (අ) වෙබ් අඩවියේ පළ කළහොත්, පළකරනු ලබන අවස්ථාවේදී, (ආ) පුවත්පතක පළ කළහොත්, එසේ පළකරනු ලබන දිනයේදී,

(ඇ) විද්‍යුත් තැපෑල මගින් යවනු ලැබුවහොත්, දැන්වීම යවනු ලබන අවස්ථාවේදී,

(ඈ) පෙරගෙවුම් තැපෑල මගින් යවනු ලැබුවහොත්, පෙරගෙවුම් ලිපිය යැවූ දිනට පසුව එළඹෙන දිනයේදී,

(ඉ) ලිඛිත පණිවුඩයක් මගින් යවනු ලැබුවහොත්, ලිඛිත පණිවුඩය යවන ලද අවස්ථාවේදී eZ Cash වෙළඳ ව්‍යාපාරික වෙත යථා පරිදි භාරදී ඇති ලෙසත්, eZ Cash වෙළඳ ව්‍යාපාරික විසින් භාරගෙන ඇති ලෙසත් සැලකිය යුතුය.

මම ශ්‍රී ලංකාවේ පදිංචිකරුවෙක් වන බවත්, වයස අවුරුදු 18 ඉක්මවුවෙක් බවත්, MSISDN අංකයේ හිමිකරු වන බවත් ප්‍රකාශ කරමි. ඉහත නියමයන් හා කොන්දේසි කියවා තේරුම්ගත් බවත්, එකී නියමයන් හා කොන්දේසි මගින් බැඳී සිටීමට එකඟ වන බවත් ප්‍රකාශ කරමි. අදාළ සියලු ගාස්තු හා අය කිරීම් ගෙවීමට යටත් වන බවට එකඟ වෙමි.

eZ Cash ගිණුමක් විවෘත කිරීම මගින් මා වෙත eZ Cash සේවාවන් සලසා දෙන ලෙස ඉල්ලා සිටිමි.

සටහන්